*සැ. යු.* - 2019.12.06 වැනි දින පළ වූ අංක 2,153 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,156 - 2019 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 320 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 321 |

*සැ. යු.* -(i) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ජනවාරි මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිසිර කුමාර හේනාධීර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1996.07.10 දින ප්‍රදානය කර ඇති කළු/ප්‍ර/කළු 2025 අංක දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන කුඩාවස්කඩුව පදිංචි මාදම්පගේ සිමියොන් සිල්වා ප්‍රදානය කොට පානදුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 39/91 යටතේ 1997.05.20 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාව ඇත්නම් එය 2020.01.20 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ උතුර පත්තුවේ 710සී, කුඩාවස්කඩුව නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නයිදූව (කුඩාවස්කඩුව) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කළුතර මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ක. 2225 අංක දරන රේඛා සටහනේ අංක 98 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.087 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| උතුරට | : 66 වැනි කැබැල්ල, |
| නැගෙනහිරට | : 99 වැනි කැබැල්ල, |
| දකුණට | : 103 වැනි කැබැල්ල, |
| බස්නාහිරට | : 97 වැනි කැබැල්ල. |

එස්. කේ. හේනාධීර,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර

2019 ඔක්තෝබර් මස 03 වැනි දින.

12-795/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ශානිකා තිරිමාන්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1968.11.28 දින ප්‍රදානය කර ඇති R 9150 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වීරකෝන් මුදියන්සේලාගේ දිසානායක වෙත ප්‍රදානය කොට මතුගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 03 යටතේ 1969.02.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.01.20 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර දකුණු මහ පත්තුවේ/කෝරලයේ 838 හැඩිගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හැඩිගල්ල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද කළුතර සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - දරන කට්ටි කැඩීමේ පිඹුරේ - විසින් සම්පාදිත අංක අ. භූ. පි. 01 දරන රේඛා සටහනේ අංක 1339 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්. 10, රූඩ් 03, පර්. 27 විශාලත්වය ඇත්තාවූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම මඩොල්ගහහේන කැළේ.

| | |
|---|---|
| උතුරට | : අ. භූ. පි. 01 හි කැ. අංක 1338 හා දෙළ රක්ෂිතය, |
| නැගෙනහිරට | : අ. භූ. පි. 01 හි රක්ෂිතය දිග හා හැඩිගල්ල දෙළ, |
| දකුණට | : අ. භූ. පි. 01 හි රක්ෂිතය දිග හා හැඩිගල්ල දෙළ, |
| බස්නාහිරට | : අ. භූ. පි. 01 හි කැ. අංක 332 සහ 1338. |

එස්. ත්‍රිමාන්න
ප්‍රාදේශීය ලේකම්,
පාලින්දනුවර.

2019 ඔක්තෝබර් මස 11 වැනි දින.

12-795/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිසිර කුමාර හේනාධීර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.07.20 දින ප්‍රදානය කර ඇති කළු/ප්‍ර/කළු 389 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මොරොන්තුඩුව පදිංචි ලොකුලියනගේ ජාලිස් අල්ලිස් වෙත ප්‍රදානය කොට පානදුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ 3/40 යටතේ 1986.09.25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.01.20 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර තොටමුණ උතුර පත්තුවේ 706 බී- මොරොන්තුඩුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මොරොන්තුඩුව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද කළුතර මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ක. 548 අංක දරන රේඛා සටහනේ අංක 39 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්. 25.2ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම්,

උතුරට : 38 වැනි කැබැල්ල,
නැගෙනහිරට : 40 වැනි කැබැල්ල ,
දකුණට : 77 වැනි කැබැල්ල සහ මාවල ගම් මායිම,
බස්නාහිරට : මාවල ගම් මායිම.

එස්. කේ. හේනාධීර,
ප්‍රාදේශීය ලේකම්,
කළුතර.

2019 සැප්තැම්බර් මස 18 වැනි දින.

12-795/3

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/60835.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :- SPLC/MAT/1/30/3/61.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 425, මැදවත්ත ග්‍රාම නිලධාරි වසමේ මැදවත්ත ගමේ මු. පි. මාර 1960 පිඹුරේ කැබලි අංක 1, 2, 3, 6, 7, 9, 10 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1386ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

කැබලි අංක 02 :
*උතුරට* : කැබලි අංක 1 සහ දන්කුරුයාය වත්ත ;
*නැගෙනහිරට* : දන්කුරුයාය වත්ත සහ කැබලි අංක 3 ;
*දකුණට* : කැබලි අංක 3 සහ 10 ;
*බටහිරට* : කැබලි අංක 10 සහ 1.

කැබලි අංක 07 :
*උතුරට* : කැබලි අංක 5 සහ 6 ;
*නැගෙනහිරට* : කැබලි අංක 6 සහ 8 ;
*දකුණට* : කැබලි අංක 8 සහ 9 ;
*බටහිරට* : කැබලි අංක 9 සහ 5.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.23 වැනි දින සිට ඉදිරියට);

*(ආ) වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය. ;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.10.23 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-972

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.